# ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2021

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ 156 වන සංවත්සරය සනිටුහන් කරන 2021 ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) සැමරීම සඳහා ශ්‍රී ලංකාව ලොව සෙසු රටවල් සමඟ එක්වන මොහොතේ උපහාර පණිවිඩයක් ලබා දීමට හැකිවීම මගේ සතුටට කරුණකි.

මෙම වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය සැමරීමේ තේමාව වන "අභියෝගාත්මක අවධියේ ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම" යන්න කෝවිඩ්-19 වසංගතය පවත්නා අවස්ථාවේදී යොදා ගැනීම වඩාත් උචිතය. එමගින් නව වැඩ පිළිවෙලක් හා ජීවන රටාවක් සහිත අනාගතයක් කරා යාමේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ අවශ්‍යතාව ගෙන හැර දක්වා තිබීම පමණක් නොව, රට රටවල් අතර සහ රටවල් අභ්‍යන්තරයේ පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යාප්ති විෂමතාවය ද හෙළිදරව් කර තිබේ. අනාගත ඩිජිටල් ආර්ථිකයන් සහ සමාජවල ඩිජිටල් පරිවර්තනය පිළිබඳ සංකල්පයට සහාය දැක්වීමේ අරමුණින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධතාවයට විශ්වීය වශයෙන් අර්ථවත් ප්‍රවේශයක් සැපයීම සහතික කිරීම පිණිස ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ "Connect 2030 න්‍යාය පත්‍රය" හි හඳුනාගෙන ඇති ප්‍රධාන මූලධර්ම හා අරමුණු ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමේ අවශ්‍යතාවය 2021 ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාවෙන් වැඩිදුරටත් විග්‍රහ කර ඇත.

ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම හා සවිබල ගැන්වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නවෝත්පාදන වැඩිදියුණු කිරීම මෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රයේ කාර්යභාරය අවධාරණය කරමින් නව න්‍යායන්ට මුහුණ දීම අත්‍යවශ්‍ය වන අතර වේගවත් නවෝත්පාදනයන් දිරිගන්වන පරිසරයක් නිර්මාණය කිරීම මෙන්ම තාක්ෂණික විශේෂඥතාව බෙදා ගැනීම සඳහා හිතකර යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැඩිදියුණු කිරීම සිදු කළ යුතුය.

ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය සමරන මෙම වැදගත් අවස්ථාවේදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වශයෙන් අප, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඩිජිටල්කරණ උපාය මාර්ග සහ සැලසුම් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ " Connect 2030" න්‍යාය පත්‍රයට අනුකූල ව්‍යාපෘති දියත් කිරීමට අවධානය යොමු කර ඇත. ග්‍රාමීය ප්‍රදේශ ආවරණය වන පරිදි දිවයින පුරා අධිවේගී අන්තර්ජාල සේවා සැපයීම සහතික කිරීම සහ සියලුම රාජ්‍ය පාසල් සහ විශ්ව විද්‍යාලවල e-ඉගෙනුම් භාවිතයන් සඳහා නොමිලේ දත්ත ලබා දීමේ වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය වැනි ඉතා වැදගත් අංශවලට දැරිය හැකි පරිදි ප්‍රවේශවීම නිසැක කිරීමේ කඩිනම් පුළුල් සැලසුම් ක්‍රියාත්මක කිරීම මෙයින් අවධාරණය කෙරේ. වැඩිදුරටත් උපායමාර්ගික මූලපිරීම් සහ ප්‍රතිපත්ති ඇතුළත් 5G නව සේවා අත්හදා බැලීම් සහ දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීමේ රාමුව සැකසීම තුළින් ඉතා වැදගත් සන්නිවේදන යටිතල පහසුකම් සහ ප්‍රතිපත්ති විශිෂ්ට ගෝලීය භාවිතයන් හා ප්‍රමිතීන්ට අනුකූලව යාවත්කාලීන කරමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ප්‍රතිලාභ මහජනතාවට ලබාගැනීමට හැකි අවස්ථා සුරක්ෂිත කරමින් පවතී.

සියලුම පාර්ශවකරුවන්ට ඵලදායී හා අර්ථවත් ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයක් වේවායි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ඕෂද සේනානායක

අධ්‍යක්ෂ ජනරාල්